**මාතලේ ප්‍රාදේශීය සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

**---------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මාතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එකතුව රු.167,447,102ක් වූ ආදායම් හා වියදම් විෂයයන් 03ක වටිනාකම රු.171,508,392ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම නිසා ආදායම්, වත්කම් හා වගකීම් රු.4,061,290ක් වැඩියෙන් ගිණුම් වල දැක්වුණි.

(ආ). එකතුව රු.108,887,116ක් වූ ගිණුම් විෂයයන් 03ක වටිනාකම රු.102,755,052ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම නිසා ආදායම් හා වියදම් රු.6,132,064ක් අඩුවෙන් ගිණුම් වල දැක්වුණි.

(ඇ). කඩා ඉවත් කර තිබුණු වටිනාකම රු.88,490ක් වූ ගොඩනැගිලිවල අගය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීම නිසා එම ගිණුමේ ශේෂය සමාන අගයෙන් වැඩියෙන්

දැක්වුණු අතර, පුස්තකාලයක් හා ක්‍රීඩාංගනයක් ඉදිකිරීම වෙනුවෙන් වැයකර තිබුණු රු.910,273ක වියදම ප්‍රාග්ධනගත කර නොතිබුණි.

(ඇ). එකතුව රු.1,419,734ක් වූ කාර්යාල උපකරණ, ලීබඩු හා සවිකිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, යන්ත්‍ර හා ලීබඩු විෂයයන් 02ක වටිනාකම රු.222,200ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ). ආයුර්වේද බෙහෙත් ශාලාවට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ස්ථාවර වත්කම් විෂයයන් 03ක වටිනාකම සහ ජේ.සී.බී යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු රු.262,500ක් ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ). පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.6,390,000ක් වටිනා ඩබල් කැබ් රථයේ වටිනාකම ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ). සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.158,464ක වියදම් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්
--------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.13,690,739ක් වූ ගිණුම් විෂයයන් 03කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.710,866ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

1.3.3. ලැබිය යුතු ගිණුම්
----------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 08ක එකතුව රු.56,439,202ක් වූ අතර, වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.2,260,625ක ශේෂ 05ක් ඊට ඇතුළත්වී තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්
----------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 10ක එකතුව රු.51,864,326ක් වූ අතර, වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.3,470,363ක ශේෂ 04ක් ඊට ඇතුළත්වී තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

---------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.40,593,272ක් වූ ගිණුම් විෂයයන් 03කට අදාළ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති,රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය | යොමුගත වගන්තියට අනුකූල නොවී මහාසභා රැස්වීම් හා විශේෂ මහාසභා රැස්වීම් සඳහා සහභාගි වීම වෙනුවෙන් සභාපති, උපසභාපති හා මන්ත්‍රීවරුන්ට රු.169,000ක පැමිණීමේ දීමනා ගෙවා තිබුණි. |
| (ආ). 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පී එෆ් 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රු.219,533ක් ගෙවා සභාව සතු වාහන 12ක රක්ෂණාවරණ පුද්ගලික රක්ෂණ සමාගමකින් ලබා ගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,288,566ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,241,697ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,046,869ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 තුළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(අ). මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත්විට එම ප්‍රතිශතයේ අඛණ්ඩ පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

(ආ). මුළු වියදම මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස ගත් විට, මෙම ප්‍රතිශතයේ අඛණ්ඩ ඉහළ යාමක් පෙන්නුම් කෙරෙන අතර, එය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණය විය.

(ඇ). ඉකුත් වර්ෂ කිහිපය තුළ කාරක ප්‍රාග්ධනයෙහි අඛණ්ඩ අඩුවීමක් පෙන්නුම් කෙරුණි.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ආදායම් රැස්කිරීම් කාර්ය සාධනය

--------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ශේෂය රු.4,497,627ක් වූ අතර, එම ශේෂය තුල අයකර ගත නොහැකි රු.546,918ක ශේෂ සහ වසර 03කට වැඩි කාලයක් ඉක්මවූ රු.1,516,233ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.2 වරිපනම් බදු

---------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.774,089ක් වූ අතර, එම ශේෂය තුළ වසර 03කට වැඩි කාලයක් ඉක්මවූ රු.62,594ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.3 අක්කර බදු

---------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.221,428ක් වූ අතර, එම ශේෂය තුළ වසර 03කට වැඩි කාලයක් ඉක්මවූ රු.206,731ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,126,203ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.9,310,027ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.4 අධිභාර

-----------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂ වලදී පනවන ලද අධිභාර වලට අදාලව රු.1,737,060ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව ගොඩනැඟිලි සැලසුම් අනුමත කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ලැබී තිබුණු අයදුම්පත් 935කින් අයදුම්පත් 686 ක් අනුමත කර තිබුණ ද අනුකුලතා සහතික නිකුත් කර තිබුණේ අයදුම්පත් 43ක් සඳහා පමණි.

3.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). පිරිවැය රු. 30,000ක් වූ යතුරු පැදියක් වසර 02ක පමණ කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට යොදවා නොගෙන සභා භූමියේ ගාල් කර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවලට සවි කිරීම සඳහා රු.343,128ක වියදමින් සකස් කර තිබුණු නාම පුවරු 58ක් අදාල ව්‍යාපෘති සඳහා භාවිතා නොකර ගබඩාවේ රඳවා තිබුණි.

3.3 හඳුනාගත් අලාභ

--------------------

සභාවේ සේවකයින් වෙනුවෙන් 2003 වර්ෂයේ සිට 2010 දක්වා කාලපරිච්ඡේදය තුළ නියමිත පරිදි සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නොයැවීම නිසා රු.104,430ක මුදලක් අධිභාර ලෙස සභා අරමුදලින් ගෙවීමට සිදුවී තිබුණි.

3.4 අවිධිමත් ගනුදෙනු

-----------------------

(අ) විවෘත මිල ගණන් කැඳවීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් මිල ගණන් ලබා නොගෙන තෝරා ගත් ටෙන්ඩර්කරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව, රාජකාරි කටයුතු සඳහා කැබ් රථයක් කුලියට ලබාගෙන රු.297,400ක වාහන කුලී සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් කැබ් රථයක් මිලදී ගැනීමේදී වාහන සුචිය(කැට්ලොග්) ඉදිරිපත් නොකිරීම මත, ඉදිරිපත් කල රු.7,390,000ක අවම මිල පිළිනොගෙන, රු.7,750,000ක මිලට මිලදී ගැනීම නිසා සභාවට රු.360,000ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| ප්‍රතිපාදන | කර්මාන්තයේ නම | වැයකර තිබුණු මුදල | භෞතිකව පරීක්ෂා කළ දිනය | අඩුපාඩුව |
|---|---|---|---|---|
| | | රු. | | |
| (අ) පළාත් නැඟුම සංවර්ධන ප්‍රදාන | අළුවිහාරය බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම. | 962,928 | 2015.05.19 | (i) ගොඩනැගිල්ල ඉදිකර කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම අරමුණු වුවද, ගොඩනැගිල්ල වසා දමා තිබුණි.<br>(ii) ගොඩනැගිල්ලේ නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) ගම නැඟුම එක් ගමකට එක් වැඩක් සංවර්ධන ප්‍රදාන | බීරිදෙවොල පළමු පටුමඟ කොන්ක්‍රීට් කිරීම. | 489,241 | 2015.05.19 | මාර්ගය නිවාස 02කට යෑම සඳහා පමණක් සංවර්ධනය කර තිබුණු අතර, මාර්ගයේ වාහන ගමනාගමනයක්ද සිදු වී නොතිබුණි. |
| (ඇ) පළාත් නැඟුම සංවර්ධන ප්‍රදාන | මැදගම්වත්ත මාර්ගයේ පැති බැමි සකස් කිරීම | 1,176,000 | 2015.05.19 | කුඹුර සහිත කොටසෙහි මාර්ගතලය ලෙස අදාල පැති බැමි යොදාගෙන තිබුණද, මාර්ග කොටස පස් පුරවා පරිහරණයට යොදා ගැනීමට හැකිවන පරිදි සකස් කර නොතිබුණි. |

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු කෙරෙන කසළ කම්කරුවන් 04 දෙනෙකු යොදවා වෙන් කිරිමෙන් අනතුරුව, කිලෝග්‍රෑම් 400ක් පමණ ප්‍රමාණයක් දෛනිකව කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම සඳහා යොදාගන්නා බවත්, එකතු කරන කසළ වලින් සියයට 40ක පමණ ප්‍රමාණයක් පොලිතින් බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර, පස්වලින් වසා දැමීමට කටයුතු කරන බවත් දක්නට ලැබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

---------------------------

ලිඛිත රාජකාරි පැවරීමකින් තොරව එක් නිලධාරියෙකු අභ්‍යන්තර විගණන අංශය සඳහා පත්කර තිබුණද, වෙනත් රාජකාරීද ඔහුට පවරා තිබීම හේතුවෙන් අපේක්ෂිත අන්දමේ අභ්‍යන්තර විගණනයක් සිදු වී නොතිබුණි.

4.2 විගණන හා කළමණාකරණ කමිටු

-----------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/ඩීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමණාකරණ කමිටු පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

4.3 අයවැය පාලනය
--------------------

(අ). ආදායම් විෂයයන් 09ක රු.6,752,000ක්වූ ඇස්තමේන්තුගත ආදායම්වලින් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණු අතර, තවත් ආදායම් විෂයයන් 20ක ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 2 සිට සියයට 66 අතර පරාසයක විචලනයන් පැවතුණි.

(ආ). වැය විෂයයන් 24ක් සඳහා වූ රු.1,148,000ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණු අතර, තවත් වැය විෂයයන් 25කට අදාල ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම අතර සියයට 1 සිට සියයට 69 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය සංශෝධනයට භාජනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්,අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.4 නොවිසඳී ඇති සහ පිළිතුරු නොලත් විගණන විමසුම්
-----------------------------------------------------------

සභාව වෙත ඉදිරිපත් කර තිබුණු විගණන විමසුම් 05කට පිළිතුරු සපයා නොතිබුණු අතර,එකී විමසුම් වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කල හැකි වටිනාකම රු.21,444,788ක් විය.

5. පද්ධති හා පාලන
------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). වත්කම් කළමනාකරණය
(ඇ). අයවැය පාලනය
(ඈ). ණයගැති හා ණයහිමි පාලනය
(ඉ). කොන්ත්‍රාත් පාලනය
(ඊ). මානව සම්පත් කළමනාකරණය